# දැන්වීම් පුවරුවට

# ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ

# නිශ්චල ඡායාරූප ශිල්පී සහ කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුරු සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නිශ්චල ඡායාරූප ශිල්පී සහ කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුරු සඳහා වන පුරප්පාඩු සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් "ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, විද්‍යා මාවත කොළඹ 07" යන ලිපිනයට 2015.12.22 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "නිශ්චල ඡායාරූප ශිල්පී / කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුරු සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කල යුතුය. මෙම තනතුරට රු.14,425 /– ක මාසික දීමනාවක් හිමි වේ.

1. සුදුසුකම්
   මෙම තනතුරු තාවකාලික වන අතර, ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරු වේ. බඳවා ගැනීම් සඳහා පහත I හා II හි සඳහන් මූලික සුදුසුකම් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

   I අධ්‍යාපන සුදුසුකම්

   අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ගණිතය සහ සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සහිතව එක්වරකදී විෂයයන් හයක් (06) සමත්ව තිබීම.

   II වෘත්තීය සුදුසුකම්

   තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

   III පළපුරුද්ද: අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ

2. වයස් සීමාව
   අයදුම්පත් බාරගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු හා අවු. 35ට නොවැඩි විය යුතුය.

3. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය
   ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියකු මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් උපරිම ලකුණු ලබාගත් ඉහත සුදුසුකම් සපුරාගත් අයදුම්කරුවන් අතුරින් බඳවා ගනු ලැබේ.

ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය